ඇලහැර ප්‍රාදේශීය සභාව
පොළොන්නරුව දිස්ත්‍රික්කය

**1. මූල්‍ය ප්‍රකාශන**

---

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

---

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජූනි 30 දින ද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජූලි 08 දිනද සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

---

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2019 දෙසැම්බර් 31 දිනට ඇලහැර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

---

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**

---

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයට අදාල මුද්දර ගාස්තු ආදායම පිළිබඳ තොරතුරු නොලැබීම හේතුවෙන් මුද්දර ගාස්තු ආදායම් ලෙස රු.150,000 ක් ඇස්තමේන්තු කර තිබුණු අතර 2018 වර්ෂයේ හිඟ මුද්දර ගාස්තු ආදායම ලෙස පළාත් භාණ්ඩාගාරය විසින් 2018 වර්ෂයේදී නිර්දේශ කරන ලද මුද්දර ගාස්තුව වූ රු.1,203,317 ක් පමණක් මූල්‍ය ප්‍රකාශනවලට ගෙන තිබුණි. | නිර්දේශ නොකරන ලද මුද්දර ගාස්තුවලට අදාලව ලිපිගොනු පරික්ෂා කර නිවැරදි මුද්දර ගාස්තුව හඳුනාගැනීමට හා ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුවේ. | තොරතුරු ලැබීමේ ප්‍රමාදය හේතුවෙන් ඇස්තමේන්තු කළ බව හා ගෙවීම් නිර්දේශ කරන ලද මුදල ගිණුම්ගත කරන බව දක්වා ඇත. |

**(ආ) නොසැසඳුණු ගිණුම්**

---

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත්කර තිබූ උපලේඛනයට, ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතුලත් රු.82,300 ක වත්කම් 02 ක් ඇතුලත් කර නොතිබුණි. | වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුවේ. | නිවැරදි කිරීමට සටහන් කර ගත් බව දක්වා ඇත. |

**(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|---|
| (i) | රු.659,390,604 ක් වූ වත්කම් හා වගකීම් විෂයයන් 07 කට අදාලව අවශ්‍ය තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | අදාල ලේඛන නඩත්තු කර පවත්වාගෙන යන බව, 2019 සමීක්ෂණ මණ්ඩල වාර්තාව සකස් කරමින් පවතින අතර 2020 දී නව ගිණුම් ප්‍රමිති වලට අනුකූලව ලේඛන සකස් කිරීමේදී පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කරන බව දන්වමි. |
| (ii) | රු.937,680 ක් වූ ආදායම් විෂයයන් 02 කට අදාලව අවශ්‍ය තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | විස්තරාත්මක උපලේඛන හා ආදායම් ලේඛන පිළියෙල කර යාවත්කාලීනව පවත්වා ගත යුතුවේ. | පිළිගෙන ඇත. 2020 සිට ආදායම් ලේඛනගත කර, යාවත්කාලීනව පවත්වා ගන්නා බව දන්වමි. |

## 1.4 අනුකූල නොවීම්

**නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

පහත දැක්වෙන නීති රීති, රෙගුලාසි හා කළමනාරකරණ තීරණවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|---|---|---|
| | | රු. | | | |
| (අ). | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | | | | |
| (i) | 24 වගන්තිය | | ප්‍රාදේශීය සභාව මගින් පවත්වාගෙන යනු ලබන පාරවල්වල හා පටු | පනත මගින් පැවරී ඇති කාර්යයන් ඉටුකිරීම සඳහා කටයුතු කළ යුතුවේ. | පිළිගතිමි. ඉදිරියේදී අදාල කටයුතු සිදුකරන බව. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | මාවත්වල නාම ලේඛන පිළිබඳ දැන්වීම් පලකිරීම සිදු කර නොතිබුණි. | | |
| (ii) | 150, 152 හා 159(1) හා (2) වගන්ති | 21,361, 018 | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු හිඟ ආදායම් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | හිඟ ආදායම් අයකර ගැනීම සඳහා පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුවේ. | පිළිගනිමි. පනතේ විධිවිධාන අනුව ඉදිරියේදී කටයුතු කරන බව දක්වා ඇත. |

2. **මූල්‍ය සමාලෝචනය**
----------------------

**2.1.** **මූල්‍ය ප්‍රතිඵල**
--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.12,891,274 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.7,134,529 ක් විය.

**2.2.** **මූල්‍ය පාලනය**
--------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|
| එකතු වටිනාකම රු.57,122 ක් පවතින බැංකු ගිණුම් 02 ක් වර්ෂ 01 ත් වර්ෂ 07 ත් අතර කාල පරාසයක සිට නිෂ්ක්‍රිය ගිණුම් ලෙස පැවතුණි. | උපයෝජනය සඳහා කටයුතු කළ යුතුවේ. | මේ සම්බන්ධව උපදෙස් ලබාගැනීමට පළාත් පාලන දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති බව සඳහන් කරමි. |

**2.3.** **ආදායම් පරිපාලනය**
----------------------

**2.3.1.** **ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම්**
--------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තු ගත ආදායම්, බිල් කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2019 ඇස්තමේන්තු-ගත ආදායම් | 2019 බිල් කල ආදායම | 2019 රැස්කල ආදායම | 2019 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2018 ඇස්තමේන්තු ගත ආදායම් | 2018 බිල් කල ආදායම | 2018 රැස්කල ආදායම | 2018 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| වරිපනම් හා බදු | 1,318,674 | 1,285,850 | 1,779,738 | 389,546 | 1,488,674 | 1,229,949 | 1,488,088 | 785,795 |
| කුලී | 8,345,000 | 8,153,570 | 10,843,230 | 3,249,760 | 10,345,800 | 17,383,010 | 12,149,925 | 6,023,920 |
| බලපත්‍ර ගාස්තු | 230,000 | 344,000 | 344,000 | - | 350,000 | 242,251 | 242,251 | - |
| වෙනත් ආදායම් | 15,973,000 | 21,590,603 | 19,210,958 | 17,505,388 | 12,100,000 | 18,830,418 | 9,386,075 | 15,125,743 |
| | 25,866,674 | 31,374,023 | 32,177,926 | 21,144,694 | 24,284,474 | 37,685,628 | 23,266,339 | 21,935,458 |

### 2.3.2. වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|
| 2004 වර්ෂයෙන් පසුව වරිපනම් බදු තක්සේරු කර නොතිබූ අතර 2004 වර්ෂයේ සිදු කරන ලද තක්සේරුව පදනම් කරගෙන බදු අයකර තිබුණි. | වර්ෂ 05 කට වරක් වරිපනම් තක්සේරු කළ යුතුවේ. | පිළිගතිමි. පළාත් පාලන දෙපාර්තමේන්තුවේ අනුමැතියට ඉදිරිපත් කර ඇති අතර, අනුමැතියෙන් පසු තක්සේරු කරන බව දන්වා ඇත. |

### 2.3.3. කුලී ආදායම

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|---|
| (අ). | කඩ කාමර 84 ක ගිවිසුම් යාවත්කාලීන කිරීමට හා නව ගිවිසුම්වලට එළඹීමට සභාව කටයුතු කර නොතිබුණි. | ගිවිසුම් යාවත්කාලීන කිරීමට කටයුතු කළ යුතුවේ. | පිළිගතිමි. ගිවිසුම් අළුත් කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. |
| (ආ). | 2019 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු කුලී ආදායම රු. 3,249,760 ක් වී තිබුණි. | හිඟ කුලී ආදායම් කඩිනමින් අයකර ගත යුතුවේ. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කරන බව දන්වමි. |
| (ඇ). | දියබෙදුම දෙහිවත්ත සතිපොළ භූමියේ කඩ කාමර 06 කින් අයවිය යුතු රු. 1,769,050 ක ටෙන්ඩර් මුදල 2019 දෙසැම්බර් 31 දින වන විටද අයකර ගෙන නොතිබුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | හිඟ මුදල් ඉතා කඩිනමින් අයකර ගන්නා බව දන්වමි. |
| (ඈ). | සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ජේ.සී.බී. යන්ත්‍රය, මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය හා ගල් රෝල කුලී පදනම මත සේවයේ යෙදවීම වෙනුවෙන් අයවිය යුතු රු.884,130 ක මුදල අයකරගෙන නොතිබුණි. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව දන්වමි. |

**2.3.4. උසාවි දඩ හා මුද්දර ගාස්තු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2019 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ රු.12,053,270 ක් හා 2018 ජනවාරි 01 දිනට ලැබිය යුතු රු.1,061,805 ක් වූ මුද්දර ගාස්තු අයකර ගෙන නොතිබුණි. | හිඟ ආදායම නිවැරදිව හඳුනාගැනීමට හා අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | හිඟ ආදායමින් සියයට 69 ක් මේ වන විට අයකර ඇති බව දන්වමි. |

## 03. මෙහෙයුම් සමාලෝචනය

### 3.1. කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුව විහරණය පහසුව හා සුබසාධනය යන සභාව විසින් ඉටු කල යුතුව තිබුණ කාර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|
| සභාව විසින් 2019 වර්ෂයේ දී ඉටු කල යුතුව තිබුණ කර්තව්‍යන් වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියල කර නොතිබුණි. | වාර්ෂික සැලැස්මක් පිළියෙල කළ යුතුවේ. | පිළිගනිමි. 2020 වෙනුවෙන් සකස් කර ඇත. |

(ආ) තිරසර සංවර්ධන ඉලක්ක

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|---|
| (i) | එක්සත් ජාතීන්ගේ සංවිධාන මඟින් හඳුන්වා දී තිබුණු තිරසර සංවර්ධන අරමුණු පිළිබඳව සභාව දැනුවත් වී තිබුණද, එම අරමුණු අතරින් සභාවට අදාල අරමුණු නිවැරදිව හඳුනාගෙන නොතිබුණු අතර, අරමුණු හා ඉලක්ක මැනීමට දර්ශක සඳහා දත්ත එක්රැස් කිරීමේ ක්‍රමවේදයක් නොතිබුණි. 2017, 2018 හා 2019 වර්ෂවල තිරසර සංවර්ධන ඉලක්ක කරා ළඟාවීම සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන සභාව විසින් හඳුනාගෙන නොතිබුණි. ඉලක්ක කරා ළඟාවීම සඳහා | සභාවට අදාලව අරමුණු හඳුනා ගැනීම, දත්ත එක්රැස් කිරීමේ ක්‍රමවේදයන් සැකසීම, මූල්‍ය ප්‍රතිපාදන කිරීම සම්බන්ධිත ආයතන හඳුනාගැනීම කළ යුතුවේ. | පිළිගනිමි. |

ආයතනයේ කාර්ය මණ්ඩලය පුහුණු කිරීමේ ක්‍රමවේදයක් හා අරමුණු ඉටුකර ගැනීම සඳහා සම්බන්ධ කරගත යුතු අනෙකුත් රාජ්‍ය ආයතන හඳුනාගෙන නොතිබුණි.

(ඇ) සන අපද්‍රව්‍ය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දිරන කසළ රිදී ඇල රක්ෂිතයට මුදාහැරීමෙන් වන පරිසර හානිය අවම කිරීම සඳහා වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි. | සන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා කටයුතු කලයුතුවේ. | 2020.02.22 සිට කෞෂිමා යන්ත්‍රයට කසළ රැගෙන යන බව දන්වමි. |

## 3.2. කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 වර්ෂයේදී පරිසර හා පහසුකම් කමිටුව විසින් ලබා දී තිබූ නිර්දේශයන් 03 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටද ක්‍රියාත්මක කර නොතිබුණි. | පරිසර කමිටු නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා සභාවේ අවධානය යොමුකල යුතුවේ. | සන පූර්ණය නොමැතිවීම නිසා කමිටුව පැවැත්වීමට නොහැකි වූ බව දන්වමි. |

## 3.3. මානව සම්පත් කළමනාකරණය

(අ). සේවක පුරප්පාඩු හා අතිරික්තය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභාවේ අනුමත තනතුරු 07 ක පුරප්පාඩු පැවති අතර, තනතුරු 14 ක අතිරික්තයක් පැවතුණි. | ආයතනයේ අවශ්‍යතාවය අනුව කාර්යමණ්ඩලය ලබාගැනීමට කටයුතු කළ යුතුවේ. | පිළිගනිමි. පුරප්පාඩු පුරවා ගැනීමටත් අතිරික්ත කාර්යය මණ්ඩලය අනුමත කරගැනීම සඳහාත් කටයුතු කරන බව දන්වමි. |

## 3.4 වත්කම් කළමනාකරණය

### 3.4.1 නිෂ්ක්‍රිය වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභාව සතු රු.332,500 ක් වටිනා සහල් පිටි නිෂ්පාදන උපකරණ වර්ෂ 10 කට අධික කාලයක සිට නිශ්කාර්යව පැවතුනි. | නිශ්ක්‍රීය වත්කම් උපයෝජනය හෝ අපහරණය සඳහා කටයුතු කළ යුතුවේ. | දෙපාර්තමේන්තු උපදෙස් ඉල්ලා ඇත. |

**04. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**4.1 අභ්‍යන්තර විගණනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි. | ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුවේ. | පිළිගනිමි. |

**4.2 විගණනය හා කළමණාකරන කමිටු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|
| 2019 වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු 01ක් පමණක් පවත්වා තිබුණි. | කාර්තුවකට එකක් වන පරිදි විගණන හා කළමනාකරණ කමිටු පැවැත්වීමට කටයුතු කළ යුතුවේ. | පිළිගනිමි. 2020 සිට කමිටු පැවැත්වීමට කටයුතු කරන බව දන්වමි. |

**4.3 නොවිසඳී ඇති විගණන නිරීක්ෂණ**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|
| දුරගමන් බස් නැවතුම්පල හා වෙළඳ සංකීර්ණය ඉදිකිරීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා සභා අනුමැතියකින් හා ශක්‍යතා අධ්‍යනයකින් තොරව කලු ගලක් කඩා ඉවත් කිරීමේ ව්‍යාපෘතිය සඳහා ගෙවූ රු.15,675,708 ක් නිෂ්කාර්යය වියදමක් වී ඇති අතර, එම මුදල හා අනෙකුත් අසම්භාව්‍ය බැරකම් සම්බන්ධව වගකිව යුතු පුද්ගලයින්ට එරෙහිව ප්‍රාදේශීය සභාවේ අවධානය යොමු කර නොතිබුණි. | නීත්‍යානුකූල නොවන ආකාරයෙන් කටයුතු කිරීම සඳහා වැය කළ මුදල් වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකළ යුතුවේ. | පිළිගනිමි. පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් විමර්ශනයක් කිරීම සඳහා ඉල්ලීම් කර ඇත. |